රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:09/99

මගේ අංකය:- 1/543ඊ/02ඩී/07,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1999.04.05 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය සේවයෙන් පළාත් රාජ්‍ය සේවයට මුදා හරින**
**ලද නිලධාරීන්ට යළි රාජ්‍ය සේවයට**
**පැමිණීමට අවස්ථාව ලබා දීම.**

රාජ්‍ය සේවයෙන් පළාත් රාජ්‍ය සේවයට නිලධාරීන් මුදා හැරීම පිළිබඳව උපදෙස් අඩංගු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.56/89, අංක.25/91, අංක.26/91 හා අංක.26/91 (1) කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය සේවයේ සිට පළාත් රාජ්‍ය සේවය සඳහා මුදා හරින ලද මාණ්ඩලික (දීප ව්‍යාප්ත සේවාවන්ගෙන් බැහැර) සහ මාණ්ඩලික නොවන ශ්‍රේණිවල නිලධාරීන් විසින් මධ්‍යම රජයේ තනතුරු සඳහා පැමිණීමට කරනු ලබන ඉල්ලීම් වලදී පහත සඳහන් කොන්දේසි මත ඔවුන් රාජ්‍යසේවයේ පුරප්පාඩු සඳහා පත් කළ හැකිවේ.

i. පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හා රාජ්‍ය සේවයට පත් කිරීම සම්බන්ධව අදාළ පත් කිරීම් බලධාරීන්ගේ එකඟත්වය තිබිය යුතු වීම.
ii. නිලධාරියා රාජ්‍ය සේවයෙ 'දිගටම සිටියේ නම් ලැබිය හැකිව තිබූ ජ්‍යෙෂ්ඨතාවය අනුව පත් කිරීම.
iii. රාජ්‍ය සේවයේ දිගටම සිටියේ නම් ලැබිය හැකිව තිබූ උසස්වීම් ඉක්මවා පළාත් රාජ්‍ය සේවයේ උසස්වීම් ලබා ගෙන ඇත්නම් එවැනි උසස්වීම් අත්හැර දැමීම.
iv. ඉහත II සහ III ක්‍රියාත්මක වීම නිසා වැටුපේ යම් සංශෝධනයක් කිරීමට සිදු වුවහොත් ඊට එකඟවීම.
V. ඉහත II, III සහ IV ආවරණය වන පරිදි දිවුරුම් පෙත්සමක් ඇමුණුම 1 අනුව ඉදිරිපත් කිරීම.

03. ඒ අනුව අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිලධාරියා නිදහස් කිරීමට එකඟත්වය ප්‍රකාශ කළ හැක.

පී.ඒ.සේනාරත්න
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

# දිවුරුම් පෙත්සමයි

මෙහි පහත අත්සන් කරන ................................................................................................................ වන
(තනතුර)
........................................................................................................................................................පදිංචි
(පදිංචි ස්ථානය)
........................................................................................................................................ වන මම ගරු
(සම්පූර්ණ නම)
ගාම්භීර පූර්වකවද, අවංකව හා සත්‍යවාදීව පහත සඳහන් ප්‍රකාශයන් කර සිටිමි/දිවුරමි.

01. මෙම දිවුරුම් පෙත්සමෙහි ප්‍රකාශකයා මම වෙමි.

02. මා රාජ්‍ය සේවයේ දිගටම සිටියේ නම්, පත් විය හැකිව තිබූ ජ්‍යෙෂ්ඨත්වයට නොවැඩි ජ්‍යෙෂ්ඨතාවයක් යටතේ පත් කිරීමත්,

03. පළාත් රාජ්‍ය සේවයේ ස්වභාවය අනුව ඉක්මන් උසස් වීම් ලබා ගෙන ඇත්නම් රාජ්‍ය සේවයේ සිටියේ නම් ලද හැකිව තිබූ ජ්‍යෙෂ්ඨතාවය දක්වා උසස්වීම් අත්හැර දැමීමට හා වැටුප් අඩු කිරීමට මගේ සිය කැමැත්ත දක්වන බවත් මෙයින් දිවුරා ප්‍රකාශ කර සිටිමි/ප්‍රතිඥා දෙමි.

04. ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි වන බව මින් ප්‍රතිඥා දෙමි:දිවුරා ප්‍රකාශ කරමි.

**ප්‍රකාශකයාගේ අත්සන.**

මෙම දිවුරුම් පෙත්සමෙහි අඩංගු කරුණු කියවා තේරුම් කර දීමෙන් අනතුරුව වර්ෂ 19............. ක් වූ ....................... මස ............. දින ............................ මා ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

.....................................................

**සමාදාන විනිශ්චයකරුගේ අත්සන**